2025 මුදල් වර්ෂය සඳහා

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ

කාර්ය සාධන වාර්තාව

2025 ஆம் ஆண்டிற்கான

காணி உரித்து நிர்ணயத் திணைக்களத்தின்

செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT

of the Land Title Settlement Department
for the Financial Year 2025

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

காணி உரித்து நிர்ணயத் திணைக்களம்

LAND TITLE SETTLEMENT DEPARTMENT

බිම් සවිය ගීතය

බිම් සවියයි බිම් සවියයි //
ඔබගේ ශක්තිය බලය සදාතන
සත දිරිගැන්වූ උදාර නාමය
බිම් සවියයි ඒ බිම් සවියයි

වාද භේද නැති උරුමය සුරකින
හවුල් අවුල් නැති පරම සවිය ඇති
නිවහල් පලසක ලක්මව සතපන
අභීත මෙහෙවර බිම් සවියයි

බිමට සවිය රන් සවියක් වන ලෙස
දිවි ඟංඟාවේ එතෙර දකින්නට
දේශ ශක්ති ස්ව ශක්ති සදාලන
අභීත මෙහෙවර බිම් සවියයි

පද රචනය	චන්දන මධුරසිංහ
සංගීතය	හිමිකම් විමර්ශන නිලධාරී/ අතිරේක රෙජිස්ට්‍රාර්
ගායනය	උඩුනුවර ප්‍රාදේශීය කාර්යාලය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ පණිවිඩය

වර්ෂ 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මේ වන විට අවු. 122 ක කාලයක් සම්පූර්ණ කර ඇත. 1903 වසරේ සිට ක්‍රමිකව විකාශනය වූ මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව යටතේ මූලික වශයෙන් පනත් දෙකක් ක්‍රියාත්මක වේ. එනම් 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත හා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතයි. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත මඟින් ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු ද, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලීන් මඟින් ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පෞද්ගලික ඉඩම් වෙන් කොට හඳුනා ගැනීමත්, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන කැඩැස්තර සිතියමේ සඳහන් ඉඩම් කැබලිවලට අදාළ හිමිකම ගැසට් කිරීම හා පෞද්ගලික ඉඩම් සඳහා හිමිකම් සහතික පත්‍රයක් ඉඩම් හිමියන් වෙත ලබාදීමත් සිදු කරනු ලබයි. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ "බිම් සවිය" වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අනගි සහයක් ලබා දෙන බවයි. ඒ සඳහා කැපවෙන සර්වේයර් ජනරාල්, අතිරේක සර්වේයර් ජනරාල් (හි.ලි.ප.) ඇතුළු කාර්යය මණ්ඩලයටත්, රෙජිස්ට්‍රාර් ජනරාල්, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හි.ලි.ප.) හා කාර්යය මණ්ඩලයටත් ඉතා කෘතඥපූර්ව වෙමි. තවද, ඉඩම් අමාත්‍යාංශය නිරන්තර උපදෙස් හා මඟ පෙන්වීමෙන් ද මූල්‍ය ප්‍රතිපාදන සලසමින් ද දෙපාර්තමේන්තුව අරමුණ කරා මෙහෙයවීමේ ප්‍රධාන නියමුවා ලෙස කටයුතු කරනු ලැබේ.

2025 වර්ෂය අවසාන වන විට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලබා ඇති භෞතික ප්‍රගතිය සලකා බැලීමේදී ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත ප්‍රකාරව නිරවුල් කරන ලද ගම්වල ප්‍රමාණය 9528 ක් කර ගැනීමටත් හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව 2025.12.31 දින දක්වා 14 වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති හිමිකම් තීරණවල සමුච්චිත එකතුව 1 110 210 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකියාව ලැබී ඇත.

කෙසේ වුවද, 1998 සිට මේ දක්වා දෙපාර්තමේන්තුව ලබා ගෙන ඇති සමස්ත ප්‍රගතිය අවම අගයක පවතින අතර ඒ සඳහා විවිධ බාහිර මෙන්ම අභ්‍යන්තර සාධකද හේතු වී ඇත. ඉඩම් නිරවුල් කිරීමට අදාළ ගැටළු ලෙස මැනුම් ආශ්‍රිත තාක්ෂණික ගැටළු මතු වීම, පැරණි ලිපිගොනු අස්ථානගතව පැවතීම, බොහෝ පැරණි සිතියම් ඇසුරින් නිරවුල් කිරීමට සිදු වීම හා එම සිතියමට අදාළව ඇති ක්ෂේත්‍රය වර්තමානයේ වෙනස් වී තිබීම, පැරණි උරුමකරුවන්ගේ විස්තර සමඟ වත්මන් උරුමකරුවන් හඳුනා ගැනීමේ දී බොහෝ දුෂ්කරතාවයන්ට ලක්වීමෙන් උරුම විභාගවලදී ප්‍රමාදයන් සිදු වීම වැනි දෑ දැක්විය හැක. මෙම බාධාවන් මධ්‍යයේ වුවද 2025 වර්ෂයේදී ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කටයුතු වල විශේෂ ප්‍රගතියක් දැකිය හැකිය. ඒ අනුව උතුරු නැගෙනහිර ප්‍රදේශවල නිරවුල් කිරීමේ කටයුතුවලට ප්‍රමුඛතාවය ලබා දීමට හැකියාව ලැබුණි. උතුරු පළාතේ ගම් සිතියම් 07ක් නිරවුල් කිරීමට අදාළව නිරවුල් කිරීමේ ප්‍රාරම්භක දැන්වීම් 07ක් 2006 වර්ෂයෙන් පසුව පළ කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණද ඒ සම්බන්ධයෙන් මතු වූ ගැටළුකාරී තත්වයන් සහ අනවබෝධයන් මෙන්ම දුර්මතයන් හේතුවෙන් අදාළ ප්‍රදේශවල නිරවුල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට 2025 වර්ෂයේදී ද හැකියාවක් නොලැබුණි. හිමිකම් ලියාපදිංචි කිරීමේ ගැටළු ලෙස පනතේ දුර්වලතා, අපේක්ෂිත කාර්ය මණ්ඩලයක් නොලැබීම, හිමිකම් නිරවුල් කිරීම වැනි සංකීර්ණ කාර්යය සඳහා පුහුණුව ලැබූ විමර්ශන කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවෙන් ඉවත්වීම, පුද්ගලික ඉඩම් පිළිබඳ හිමිකම් තීරණය කිරීමේදී ක්ෂේත්‍ර විමර්ශනයේදී මතුව ඇති අනපේක්ෂිත තත්ත්වයන් හා ඉඩම් ආශ්‍රිත නඩු විශාල සංඛ්‍යාවක් පැවතීම වැනි ගැටළු සඳහන් කළ හැක.

නමුත් එම බාධක මඟ හරවා ගනිමින් ඉදිරියේදී මුහුණ දීමට ඇති අභියෝගද ජයගනිමින් සාර්ථක ප්‍රගතියක් කරා ළඟා වීමට 2025 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට හැකි විය. ඒ යටතේ 2025.12.31 දින වන විට දිස්ත්‍රික්ක 25ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 121ක් තුළ බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත කර ඇති අතර 2026 වර්ෂයේදී එම දිස්ත්‍රික්ක 25 තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341ක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. තවද කැඩැස්තර සිතියම් සකස්කර ඇති සියලුම රජයේ ඉඩම් හිමිකම් පනත යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රධාන කාර්යලය මඟින් ඉටුකිරීමට හා 2025 අයවැය යටතේ ගරු ජනාධිපති/ මුදල් අමාත්‍ය විසින් "ඉඩම් හිමිකම් සංවර්ධනයට සහ ඉඩම්වල වාණිජමය භාවිතය වැඩි කිරීම" සඳහා බිම් සවිය වැඩසටහන කඩිනම් කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින් ප්‍රාදේශීය කාර්යාල ව්‍යාප්ත කර ප්‍රාදේශීය කාර්යාල මඟින් ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව වැඩි කරමින් වැඩි ප්‍රගතියක් ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත.

තවද, දෙපාර්තමේන්තුවේ හිමිකම් ලියාපදිංචි කිරීමේ කර්තව්‍යයේ ප්‍රමිතිකරණයට වඩාත් වැදගත්වන සම්මත කාර්යය පටිපාටිය සකස් කර ප්‍රකාශයට පත් කිරීමට හැකියාව ලැබුණි. තවද, හිමිකම් ලියාපදිංචිය කාර්යක්ෂම කිරීම සඳහා රාජ්‍ය සේවයේ ඩිජිටල්කරණයට අනුගත වෙමින් සකස් කර ඇති e – tittle පද්ධතිය වඩාත් දියුණු තත්ත්වයට ගෙන ඒමට හැකි විය.

අවසාන වශයෙන් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් මහජනතාව අපේක්ෂා කරන සේවාව උපරිම අයුරින් ලබා දීමට කැපවෙන සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන්ටත්, විශේෂයෙන් ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන්ටත්, සහකාර හිමිකම් විමර්ශන නිලධාරින්ටත්, ඒ සඳහා සහය ලබාදෙන අනෙකුත් ආයතන හා ඒවායේ කාර්යමණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතවේදිත්වය පළ කරමි.

ශ්‍රී ලංකාව, දීර්ඝ ඉතිහාසයක් සහිත නිසාම ඉඩම් හිමිකම් නිරවුල් කිරීම පිළිබඳ සංකීර්ණ නීති සම්ප්‍රදායන්, භාවිතයන්ගෙන් මෙන්ම විවිත්‍ර ආකල්පයන්ගෙන් යුත් ජනතාවක් සහිත රටක් වන අතර එම ගැටළුකාරී සංකීර්ණ තත්ත්වයන් අවම කර ගනිමින් සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක් ලබා දීමට කටයුතු කිරීම ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඒකායන අරමුණ වේ. මේ සඳහා මහජනතාව ඉඩම් හිමිකම් නිරවුල් කරගැනීමට ඇති කැමැත්ත, හිමිකම් සහතිකයක් ලබාගැනීම සඳහා ඇති උද්යෝගය මත දෙපාර්තමේන්තමේන්තුවේ ප්‍රගතිය අත්කරගැනීමට හැකිවනු ඇත.

පී.සී.ඩී. සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා
නිරවුල් කිරීමේ නිලධාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

පී.සී.ඩී. සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

පටුන

පරිච්ඡේදය 01 1
ආයතනික පැතිකඩ 1
1.1. හැඳින්වීම 1
1.2. අරමුණු හා මෙහෙවර දැක්ම ආයතනයේ 2
1.3. කාර්යයන් 3
1.4. සංවිධාන සටහන 4
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 4
1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/අරමුදල් 6
1.7. විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 6

පරිච්ඡේදය 02 7
ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7
පරිච්ඡේදය 03 8
වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය 8
3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 8
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 9
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 10
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 16
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 16
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.... 16
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 17
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 17
පරිච්ඡේදය 04 18
කාර්ය සාධන දර්ශක 18
4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 18
පරිච්ඡේදය 05 21
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 21
5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 21
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 21
පරිච්ඡේදය 06 22
මානව සම්පත් පැතිකඩ 22
6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 22
ආයතනයේ 6.2 22
6.3 මානව සම්පත් සංවර්ධනය 22
පරිච්ඡේදය 07 24
අනුකූලතා වාර්තාව 24

ඇමුණුම්

01. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

02. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

03. 2025 වර්ෂයට අදාළ සමුච්චිත බැදීම්/වගකීම් පිළිබඳ *CIGAS* වාර්තාව

04. විගණකාධිපතිවරයාගේ වාර්තාව

2025 මුදල් වර්ෂය සඳහා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ
කාර්ය සාධන වාර්තාව

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

දෙපාර්තමේන්තු ඉතිහාසය

ඉඩම් නිරවුල් කිරීම යනු රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් වෙන් වෙන් වශයෙන් තීන්දු කර පුද්ගලික ලෙස තීන්දු කළ ඉඩම් අදාළ උරුමකරුවන් වෙත පුද්ගලික අයිතියට පවරා දීමත් එම ඉඩම් සඳහා ඔවුනට පිඹුරුපතක් නිකුත් කිරීමත් රජය සතු ඉඩම් රජය වෙත පවරා දීමත්ය. මෙවැනි ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වූයේ යම්කිසි ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. වසර දහස් ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ඉඩම් භුක්ති විඳීමත්, පරිහරණය කිරීමත් කළ ද ඔවුන්ට එම ඉඩම්වල අයිතිය පවරා දීමක් සිදු නොවීය. ඉඩම්වල හිමිකම සනාථ කළ හැකි ඔප්පු තිරප්පු වැනි ලිඛිත සාක්ෂි කිසිවක් ඔවුන්ට නොවීය. මෙවැනි තත්ත්වයක් යටතේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම වැළැක්වීමට 1840 අංක 12 දරන ඉඩම් ආඥා පනත ප්‍රකාශයට පත් කරන ලදී.

මුලික වශයෙන් එම ආඥා පනතින් ප්‍රකාශ කරන ලද්දේ යම්කිසි පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජසන්තක වන බවයි. මිනිසුන්ගේ පරම්පරාගත භුක්තිය හා වගාව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සැලකිල්ලට නොගන්නා ලදී. ඔවුන් අදහස් කළේ අයිතිය සනාථ කිරිම ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි මඟින් කළ යුතු බවයි. මෙම තත්ත්වය යටතේ 1840 ඉඩම් ආඥා පනත නිසා මිනිසුන්ගේ ඉඩම් අක්කර දහස් ගණනින් ඔවුනට අහිමි විය. ලංකාවේ ජනතාවට සිදු වූ මෙම අසාධාරණය පිළිබඳව එවකට සිටි ලංකාවේ දේශීය නායකයින් සිය විරෝධතාවය හා කනස්සල්ල ප්‍රකාශ කරන ලදී. මේ අනුව මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් රජයේ ඉඩම් මොනවාද පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කිරීමේ නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදු විය. ඒ අනුව 1897 අංක 01 දරන මුඩු බිම් ආඥා පනත පනවන ලදී. මුලින් දිසාපතිවරුන් හා විශේෂ නිලධාරින් විසින් ක්‍රියාත්මක කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. මුඩුබිම් ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ අඩුපාඩු හා ඉන් ජනතාවට සිදු වූ අසාධාරණකම් නැති කර

ගැනීමේදී වඩාත් නිවැරදිවූත් නීත්‍යානුකූලවූත් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත පනවන ලදී.

දෙපාර්තමේන්තුවට අදාළ වූ මෙම ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය එසේම පවතින අතරතුරදී 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීම මත ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයටද අවතීර්ණ විය. රජයේ සහ පුද්ගලික ඉඩම් වල අයිතිය තහවුරු කිරීම තුළින් දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීමත් ඉඩම් හා සම්බන්ධ වංචා, දූෂණ අවම කිරීමත් මෙහි ප්‍රමුඛ අරමුණ වේ. එමෙන්ම එකී කාර්ය භාරය වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරය බවට පත්වී ඇත.

1903 සිට 2025 දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නාම ලේඛනය

(ඇමුණුම් අංක 01 හි දක්වා ඇත)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක්

මෙහෙවර ප්‍රකාශය

ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළින් රජයේ හා පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කොට, සෑම බිම් කොටසකම හිමිකම තහවුරු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයකට දායක වීම.

අරමුණු

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පුද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීම.
2. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදුකිරීම සහ හිමිකම් තීරණය කිරීම ඇතුළු අනෙකුත් කටයුතු කිරීම.
3. ආයතනික හැකියාව ශක්තිමත් කිරීම මඟින් හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම.
4. මනා ක්‍රියාකාරිත්වයකින් යුත් හිමිකම් විමර්ශන කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙ යාම මඟින් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.
5. හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතුවල සියලු අවස්ථාවන් සඳහා මහජන සහයෝගය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
6. ඉඩම් අයිතිය පිළිබඳ කාර්යක්ෂම සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. කාර්යක්ෂම පරිපාලන සහ ගිණුම් ක්‍රම පවත්වාගෙන යාම.

1.3 කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමට අදාළ කටයුතු වන,

අ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

ආ) උරුම අයදුම්පත් කැඳවීම

ඇ) හිමිකම් විමර්ශන පැවැත්වීම

ඈ) හිමිකම් තීරණය කිරීම

ඉ) හිමිකම් තීරණය ගැසට් කිරීම යනාදිය ඉටු කිරීම.

❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන,

අ) නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම

ආ) නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම

ඇ) නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම

ඈ) නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම යනාදිය ඉටු කිරීම.

❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු වලදී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

❖ කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.

❖ හිමිකම් විමර්ශනය සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

❖ හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.

❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.

❖ හිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබා ගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.

❖ ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරා ගැනීමට අවකාශ සැලසීම.

❖ වාර්ෂික ඇස්තමේන්තු, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරින්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

1.4 සංවිධාන සටහන

(ඇමුණුම් අංක 02 හි දක්වා ඇත)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- හිමිකම් නිරවුල් කිරීමේ අංශය
- ඉඩම් නිරවුල් කිරීමේ අංශය

දෙපාර්තමේන්තුවේ හිමිකම් ලියාපදිංචිය යටතේ පවතින ප්‍රාදේශීය කාර්යාල හා ආවරණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය කාර්යාල	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
1	බස්නාහිර	කොළඹ	හෝමාගම	හෝමාගම
2				කඩුවෙල
3				මහරගම
4			මොරටුව	මොරටුව
5			කැස්බෑව	කැස්බෑව
6			රත්මලාන	රත්මලාන
7			දෙහිවල	දෙහිවල
8			කෝට්ටේ	කෝට්ටේ
9			කොළඹ	තිඹිරිගස්යාය
10		ගම්පහ	මිනුවන්ගොඩ	දිවුලපිටිය
11				මිනුවන්ගොඩ
12			මීරිගම	මීරිගම I/II
13			මහර	මහර
14			අත්තනගල්ල	අත්තනගල්ල
15			දොම්පේ	දොම්පේ
16			ගම්පහ	ගම්පහ
17				ජා ඇල
18				වත්තල
19			කටාන	කටාන
20				මීගමුව
21		කළුතර	පානදුර	පානදුර
22				හොරණ
23				ඉංගිරිය
24			කළුතර	කළුතර
25				මතුගම
26			බුලත්සිංහල	බුලත්සිංහල
27	සබරගමුව	රත්නපුර	බලංගොඩ	බලංගොඩ
28				ඉඹුල්පේ
29			වැලිගෙපොල	වැලිගෙපොල
30			ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය
31				ගොඩකවෙල
32			රත්නපුරය	රත්නපුරය
33				නිවිතිගල
34				පැල්මඩුල්ල
35			කුරුවිට	කුරුවිට

36	සබරගමුව	රත්නපුර	කුරුවිට	අයගම
37		කෑගල්ල	ගලිගමුව	ගලිගමුව
38				කෑගල්ල
39			රුවන්වැල්ල	රුවන්වැල්ල
40	දකුණ	ගාල්ල	ගාල්ල	ගාල්ල කඩවත් සතර
41				බෝපේපෝද්දල
42			හික්කඩුව	හික්කඩුව
43				මාදම්පාගම
44				රත්ගම
45			ඇල්පිටිය	ඇල්පිටිය
46				වැලිවිටිය දිවිතුර
47		මාතර	වැලිගම	වැලිගම
48			මාතර	මාතර
49				කිරින්ද පුහුල්වැල්ල
50				දික්වැල්ල
51				දෙවිනුවර
52				අකුරුස්ස
53			හක්මන	හක්මන
54		හම්බන්තොට	තිස්සමහාරාමය	ලුණුගම්වෙහෙර
55				තිස්සමහාරාමය
56				හම්බන්තොට
57			බෙලිඅත්ත	බෙලිඅත්ත
58				තංගල්ල
59	වයඹ	කුරුණෑගල	රිදීගම	රිදීගම
60				ඉබ්බාගමුව
61			මල්ලවපිටිය	මල්ලවපිටිය
62				පොල්ගහවෙල
63			කුරුණෑගල	කුරුණෑගල
64				ගනේවත්ත
65			පන්නල	පන්නල
66				කුලියාපිටිය බටහිර
67				අලව්ව
68			වාරියපොල	වාරියපොල
69				ගිරිබාව
70				මහව
71				නිකවැරටිය
72		පුත්තලම	නාත්තන්ඩිය	වෙන්නප්පුව
73				නාත්තන්ඩිය
74			පුත්තලම	පුත්තලම
75	මධ්‍යම	මහනුවර	දොළුව/උඩපළාත	දොළුව/උඩපළාත
76				ගඟඉහලකෝරලේ
77			යටිනුවර	යටිනුවර
78				පූජා පිටිය
79			උඩුනුවර	උඩුනුවර
80			හාරිස්පත්තුව	හාරිස්පත්තුව
81			ගඟවටකෝරලේ	ගඟවටකෝරලේ
82		නුවරඑළිය	කොත්මලේ	කොත්මලේ
83		මාතලේ	දඹුල්ල	දඹුල්ල
84				නාවුල
85			ගලේවෙල	ගලේවෙල

86	මධ්‍යම	මාතලේ	ගලේවෙල	විල්ගමුව
87				පල්ලෙපොල
88	උතුරු මැද	අනුරාධපුර	තඹුත්තේගම	තඹුත්තේගම
89				තලාව
90				රාජාංගනය
91			නැගෙනහිර නුවරගම් පළාත	නොච්චියාගම
92				ගල්නෑව
93				නාච්චදූව
94				නැගෙනහිර නුවරගම් පළාත
95				මිහින්තලේ
96				තිරප්පනේ
97		පොළොන්නරුව	හිඟුරක්ගොඩ	මැදිරිගිරිය
98				හිඟුරක්ගොඩ
99			තමන්කඩුව	වැලිකන්ද
100				තමන්කඩුව
101				ලංකාපුර
102				දිඹුලාගල
103	ඌව	මොණරාගල	මොණරාගල	සියඹලාණ්ඩුව
104				මොණරාගල
105				බුත්තල
106				වැල්ලවාය
107				මැදගම
108		බදුල්ල	මහියංගනය	රිදීමාලියද්ද
109				මහියංගනය
110				මිනිපේ (මහනුවර දිස්.)
111	නැගෙනහිර	මඩකලපුව	මඩකලපුව	මන්මුනේ උතුර
112				මන්මුනේ බටහිර
113				මන්මුනේ දකුණ බටහිර
114		අම්පාර	ප්‍රධාන කාර්යාලය	අම්පාර
115		ත්‍රිකුණාමලය		ත්‍රිකුණාමලය
116	උතුර	යාපනය	නල්ලූර්	නල්ලූර්
117		කිලිනොච්චිය	ප්‍රධාන කාර්යාලය	කරච්චි
118		මන්නාරම		මන්නාරම
119		මුලතිව්		තුනුක්කායි
120		වවුනියාව	වවුනියාව	වවුනියාව
121				වෙන්ගලචෙඩ්ඩිකුලම්

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්0020

අදාළ නොවේ.

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාළ නොවේ.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2025 වර්ෂයේදී 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් 2381ක ඉඩම් කැබලි 162 155ක් මැනුම් සිදු කර අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර කැබලි 75 008ක් සම්බන්ධයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත.

මෙය 2024 වර්ෂයේදී පිළිවෙලින් සිතියම් 1169 ක ඉඩම් කැබලි 110 462ක් හා 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දෙන ඉඩම් කැබලි 62 610ක් වේ.

එමෙන්ම පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතුරින් මෙම (2025) වර්ෂයේදී ඉඩම් කැබලි 59304ක් ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර ඉඩම් කැබලි 48 058ක් හා සම්බන්ධ උපලේඛන හිමිකම් ලියාපදිංචිය සඳහා සහ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යොමු කොට ඇත. හිමිකම් ප්‍රකාශිත ගැසට් නිවේදනය පිළිබඳ විරෝධතාවයක් ඇතොත් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාසයක කාල පරාසයකින් පසු හිමිකම් සහතික සැකසීම සඳහා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට යොමු කරන අතර 2026 වර්ෂය සඳහා 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට අපේක්ෂිත ඉලක්කය ඉඩම් කැබලි 106 954 බවද සඳහන් කරමි.

....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම :- ඩී.පී.වික්‍රමසිංහ
තනතුර :- ලේකම් - කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
දිනය :- 2026.03.10

....

ගණන් දීමේ නිලධාරි
නම :- පී.සී.ඩී.සිගේරා
තනතුර:- ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
දිනය :- 2026.03.09

පී.සී.ඩී. සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා
නිරවුල් කිරීමේ නිලධාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

රු.

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	තත්‍ය 2025	2024	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ඒසීඒ-1
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,039,780,720	897,076,000	ඒසීඒ-3
-	තැන්පතු		5,306,570	952,311	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		37,635,196	34,455,947	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,082,722,486**	**932,484,258**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,082,722,486**	**932,484,258**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		**13,392,000**	**-**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**1,069,330,486**	**932,484,258**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
848,357,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	845,476,538	728,333,222	
27,163,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	26,577,350	34,727,429	ඒසීඒ-2(ii)
5,600,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	5,538,477	6,349,781	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
881,120,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**877,592,365**	**769,410,432**	
	මූලධන වියදම්				
6,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,273,030	14,015,423	ඒසීඒ-2(ii)
17,150,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	8,239,606	5,478,439	ඒසීඒ-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ඒසීඒ-2(ii)
30,000	හැකියා වර්ධනය	14	28,500	1,482,898	ඒසීඒ-2(ii)
17,400,000	වෙනත් මූලධන වියදම්	15	14,576,159	6,682,404	ඒසීඒ-2(ii)
40,580,000	**මුළු මූලධන වියදම් (උ)**		**27,117,295**	**27,659,164**	
	තැන්පතු ගෙවීම්		5,766,604	2,943,377	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		59,601,391	47,845,610	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		65,367,995	50,788,987	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		970,077,655	847,858,583	
-	දෙසැම්බර් 31 දිනට **ශේෂය ඒ = (ඉ-එ)**		**99,252,831**	**84,625,675**	
	අඩුම ගැලපුම් ප්‍රකාශය අනුව ශේෂය		**99,252,831**	**84,625,675**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	346,117,154	318,769,115
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	96,660,440	74,694,245
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**442,777,594**	**393,463,360**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		96,559,223	74,132,994
දේපළ පිරියත හා උපකරණ සංචිතය		346,117,154	318,769,115
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	101,217	561,251
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**442,777,594**	**393,463,360**

පිටු අංක 07 සිට 29 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 30 සිට 54 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි	ගණන් දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරී
නම : ඩී.පී.වික්‍රමසිංහ	නම : පී.සී.ඩී.සිගේරා	නම : එම්.එස්.එම්.පෙරේරා
තනතුර : ලේකම්- කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය	තනතුර : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්	දිනය: 2026.03. [illegible]
දිනය : 2026.03. [illegible]	දිනය:2026.03. [illegible]	

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2025 රු.	2024 (නැවත ගලපන ලද) රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	52,141,057	42,379,283
අග්‍රිම ලැබීම්	1,039,780,720	897,076,000
අත්තිකාරම් අයකර ගැනීම්	40,408,102	38,861,110
තැන්පතු ලැබීම්	5,306,570	952,311
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,137,636,449	979,268,704
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	867,435,252	756,869,765
සහනාධාර සහ මාරුකිරීම්	5,538,477	6,349,781
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	8,239,606	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	158,785,430	137,308,358
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	13,392,000	-
අත්තිකාරම් ගෙවීම්	59,601,391	48,364,135
තැන්පතු ගෙවීම්	5,766,604	2,943,377
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	1,118,758,760	951,835,416
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	18,877,689	27,433,288
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම් ,මිලදී ගැනීම් හා වෙනත් අයෝජන අත්පත් කර ගැනීම්	18,877,689	27,433,288
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	18,877,689	27,433,288
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(18,877,689)	(27,433,288)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඇමුණුම - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:287

වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම්/ කපාහැරීම්/ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	0	0.00
රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

අලාභයේ ස්වභාය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.	0	0.00
2.	0	0.00
එකතුව	0	0.00

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	0	0.00
රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.	0	0.00
2.	0	0.00
එකතුව	0	0.00

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.0.00

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ. 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

....

ප්‍රධාන ගණකාධිකාරී
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2026.03.

එම්.එස්.එම්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ඇමුණුම (ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

1. වර්ෂය තුළ සිදු වූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i) රු.25,000.00 අඩු	0	0.00
(ii) රු.25,000.01 වැඩි	0	0.00
එකතුව	0	0.00

2. වර්ෂය තුළ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය (රු.)	අලාභයේ වටිනාකම (රු.)	අයකර ගැනීම් (රු.)	පොතෙන් කපා හල අගය (රු.)	කපා නොහල ඉදිරියට ගෙන යන ශේෂය (රු.)	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1 -	-	-	-	-	-	
2						
3						
4						
5						
එකතුව	-	-	-	-	-	

සටහන - සටහන (i) හි අතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ.109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

....
ප්‍රධාන ගණකාධිකාරි
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2026.03. ०८

එම්.එස්.එම්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර
බත්තරමුල්ල

2025 වර්ෂය සඳහා සමුච්චිත බැඳීම්/බැරකම් (වගකීම්) වාර්තාව
මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය: 287
දෙපාර්තමේන්තුවේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වැඩසටහන් අංකය හා නාමය : 02 සංවර්ධන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
-								-
එකතුව								-
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
Sri Lanka Telecom		2	1	0	1402			48,391.36
එකතුව								48,391.36
3. වෙනත් (පෞද්ගලික අංශය)								
Softlogic Information Technologies Pvt (Ltd)		2	1	0	1201			73,750.00
P A Ariyadasa & Sons		2	1	0	1202(009)			434,059.00
එකතුව								507,809.00
මුළු එකතුව								556,200.36

- 2025 වසරේ සමුච්චිත බැඳීම්/බැරකම් (වගකීම්) CIGAS වාර්තාව ඇමුණුම 03 හි ඇත.

එම්.එස්.එම්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

ප්‍රධාන ගණකාධිකාරී
එම්.එස්.එම්.පෙරේරා
දිනය - 2026.03. ०६

ඇමුණුම - (iv)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287
වැඩසටහන් අංකය හා නාමය : වැඩසටහන 02

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		නැත		

ප්‍රධාන ගණකාධිකාරී
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2026.03.06 .

එම්.එස්.එම්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	**2025.12.31** දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	**2025.12.31** දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2025.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව	208100259027251	48,152,640.10	0	0	2025 ජනවාරි

....
ප්‍රධාන ගණකාධිකාරි
එම්.එස්.එම්.පෙරේරා
දිනය : 2026.03. 06

එම්.එස්.එම්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	843,000,000	881,120,000	877,592,366	99.6%
ප්‍රාග්ධන	24,000,000	40,580,000	27,117,294	66.82%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	ඉඩම් අමත්‍යාංශය	බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම	360,800,000	195,800,000	152,298,403	77%
2	විශ්‍රාම වැටුප් දෙපා.	අත්තිකාරම් B ගිණුම ණය අය කර ගැනීම	1,740,558	1,740,558	1,740,558	100%
3	මැතිවරණ දෙපාර්තමේන්තුව	මැතිවරණ රාජකාරි හා දීමනා	4,746,469	4,746,469	4,746,469	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	23,415,000	23,415,000	-	100%
9152	යන්ත්‍රෝපකරණ (වාහනද ඇතුලත්ව)	280,021,490	280,021,490	-	100%
9153	ඉඩම්	36,285,000	36,285,000	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	6,395,664	6,395,664	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(අවසන් වාර්තාවට ඇතුලත් වේ.)

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

(I) 1998 අංක 21 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	* සංශෝධිත ඉලක්කය (ඉඩම් කැබලි සංඛ්‍යාව)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
12 වගන්තිය යටතේ ගැසට් කිරීම	94,350	>100%*1		
බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන	94,350			61.57%
හිමිකම් විමර්ශන පැවැත්වීම	124,350		84.64%	
ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම	96,045	<50%*2		
14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම	93,440	80.27%		
14 වගන්තිය යටතේ ගැසට් කිරීම	93,440			63.46%
හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම	65,408		73.47%	

* 2025 වර්ෂය මැද මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් බිම් සවිය මැනුම් සංඛ්‍යාවෙහි සංශෝධනයක් ඉදිරිපත් කරන ලදි. ඒ අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට ලැබෙන මැනුම් සංඛ්‍යාව අඩු වන බැවින් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඉලක්ක ද සංශෝධනය කිරීමට සිදු විය.

>100%*1 12 වගන්තිය යටතේ ගැසට් කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 171.86% කි.

<50%*2 ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂණ සංඛ්‍යාවට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 39.55% කි.

(II) 1931 අංක 20 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	ඉලක්කය (ගම්මාන සංඛ්‍යාව)	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% -90%	75%-89%	50%-74%
නිරවුල් කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම	7	<50%[*1]		
උරුම විභාග පැවැත්වීම	35		82.85%	
මැන වෙන් කිරීම පරීක්ෂා කර නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධානය සැකසීම	8	100%		
නිරවුල් කරන ලද ඉඩම් සඳහා රේඛා සටහන් ඉල්ලුම් පත්‍ර පිළියෙල කර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වෙතින් රේඛා චිත්‍ර ගෙන්වා ගැනීම	3	<50%[*2]		
නිරවුල් කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම	6	<50%[*3]		
නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යැවීම	6	>100%[*4]		
නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම	7	>100%[*5]		
නිරවුල් කිරීමේ ආඥා ප්‍රසිද්ධ කරන ලද ගැසට්පත් (ඔප්පු හා පිඹුරුපත්) උරුමකරුවන්ට බෙදාදීම	5	<50%[*6]		
නිදහස් කරන ලද ගම් ගණන	8	>100%[*7]		

<50%[*1] නිරවුල් කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 0 % කි. ගැසට් නිවේදනයන් 07ක් ප්‍රකාශයට පත් කළ ද ඒ සඳහා අභියාචනයන් හා කැබිනට් අනුමැතිය මත අදාළ ගැසට් ඉවත් කර ගැනීමට සිදු වීම.

<50%[*2] නිරවුල් කරන ලද ඉඩම් සඳහා රේඛා සටහන් ඉල්ලුම් පත්‍ර පිළියෙල කර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වෙතින් රේඛා චිත්‍ර ගෙන්වා ගැනීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 0 % කි.

<50%[*3] නිරවුල් කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 16.66 % කි.

>100%[*4] නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යැවීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 466.6 % කි.

>100%[*5] නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 257.1% කි.

<50%[*6] නිරවුල් කිරීමේ ආඥා ප්‍රසිද්ධ කරන ලද ගැසට්පත් (ඔප්පු හා පිඹුරුපත්) උරුමකරුවන්ට බෙදාදීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 0% කි.

>100%[*7] නිදහස් කරන ලද ගම් ගණනට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 125% කි

1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත ප්‍රකාරව ශ්‍රී ලංකා භූමිය සතු ඉඩම් කොටස්වල අයිතිය රජය සතුද, පුද්ගලික ද යන්න තීරණය කරනු ලබයි. මෙකී කාර්යය සඳහා වැඩ පියවරයන් කිහිපයක් අනුගමනය කරනු ලබන අතර එකී වැඩ පියවරයන්ගෙන් ප්‍රධානතම වැඩ පියවරයන්ට අදාලව 2025 වර්ෂයේ දී අත්කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය ඉහතින් දැක්වේ.

ඒ අනුව ඉඩම් නිරවුල් කිරීමේ මූලිකම වැඩ පියවරක් ලෙස නිරවුල් කිරීමේ ප්‍රාරම්භක දැන්වීම් පලකිරීම හැඳින්විය හැකි අතර 2025 වර්ෂය සඳහා උතුරු පළාතේ ගම් සිතියම් 07ක් ආවරණය කරමින් නිරවුල් කිරීමේ දැන්වීම් 07ක් පල කිරීමට කටයුතු කරන ලද අතර එම දැන්වීම් සම්බන්ධයෙන් අදාල ප්‍රදේශවල වෙසෙන ජනතාව සහ මහජන නියෝජිතයින් තුල හටගත් දුර්මතයන් සහ අනවබෝධයන් හේතුවෙන් ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සහ විධිමක් දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව නැවත එම කටයුතු ආරම්භ කිරීමට යටත්ව එසේ පල කරන ලද නිරවුල් කිරීමේ දැන්වීම් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලදී.

2025 වර්ෂයේ ඉඩම් නිරවුල් කිරීමේ උරුම විභාග සහ ක්ෂේත්‍ර ගත ඉඩම් පරීක්ෂා කිරීමේ කටයුතුවලට අදාල ප්‍රදේශ බොහෝමයක් උතුරු සහ නැගෙනහිර පළාත්වලට අයත් වූ අතර 82.85 % ක භෞතික ප්‍රගතියක් අත් කර ගැනීමට හැකියාව ලැබුණි.

පුද්ගලික ලෙස නිරවුල් කරන ලද ඉඩම් කොටස් සඳහා “ S ” රේඛා චිත්‍ර ඉල්ලුම් කිරීමට අපේක්ෂිත සිතියම් ගත ප්‍රදේශ 03ක් 2025 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණද අදාල ප්‍රදේශවල උරුම විභාග සහ ඉඩම් පරීක්ෂාවන් සිදු කිරීමේදී එම ප්‍රදේශවල පුද්ගලික ඉඩම් නොපැවතීම හේතුවෙන්“ S ” රේඛා චිත්‍ර අයඳුම් කිරීමේ අවශ්‍යතාවයක් 2025 වර්ෂයේ මතු නොවීය. එම හේතුවෙන් සහ ඉඩම් මැනීමේ කටයුතු ප්‍රමාද වීම වැනි කරුණු හේතුවෙන් ඉඩම් ලියාපදිංචි කිරීමේ භෞතික ප්‍රගතිය 16.6 % ක අවම මට්ටමක පැවතිණි.

2025 වර්ෂයේදී පවත්වන ලද උරුම විභාග සහ ඉඩම් පරීක්ෂාවන් හී දී අදාළ ප්‍රදේශවල රජය සතු ඉඩම් බහුලව පැවතීම හේතුවෙන් ඉඩම් කොටස් මැන වෙන් කිරීම් , “ S ” රේඛා චිත්‍ර ඉල්ලීම් සහ ඉඩම් කොටස් ලියාපදිංචි කිරීම වැනි වැඩ පියවරයන් අනුගමනය කිරීම අවශ්‍ය නොවීම හේතුවෙන් එම සිතියම්ගත ප්‍රදේශවල නිරවුල් කිරීමේ අඥාව ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යොමු කිරීම, නිරවුල් කිරීමේ ආඥාව ගැසට් නිවේදනයේ පලකිරීම සහ අවසන් වාර්තා ලිවීම වැනි වැඩ පියවරයන් මෙම වර්ෂය තුළ කඩිනමින් අවසන් කිරීමට හැකියාව ලැබීම හේතුවෙන් අදාල වැඩ පියවරයන්ගේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක ඉක්මවා ළඟා කර ගැනීමට හැකියාව ලැබුණි.

නිරවුල් කිරීමේ ආඥාවන් ගැසට් නිවේදනයේ පල කිරීමේ කටයුතු 2025 වර්ෂයේ නොවැම්බර් මස අගභාගයේදී පමණ සිදු කිරීමත් ,එම කාලසීමාව තුළ දිවයිනට බලපෑ අයහපත් කාලගුණික තත්ත්වය ද හේතුවෙන් ගැසට් නිවේදන උරුමකරුවන් වෙත බෙදාදීමේ කටයුතු සිදු කිරීමට මෙම වර්ෂය තුළ හැකියාවක් නොලැබුණ අතර එම කටයුතු 2026 වර්ෂයේ පළමු කාර්තුව තුළ නිම කිරීමට අපේක්ෂිත වේ.

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5 1.හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු (SDG 1.4)

<table>
<tr><th rowspan="2">ඉලක්කය / අරමුණු</th><th rowspan="2">ඉලක්කය</th><th rowspan="2">ජයග්‍රහණ දර්ශක</th><th colspan="3">මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය</th></tr>
<tr><th>0% - 49%</th><th>50% - 74%</th><th>75% -100%</th></tr>
<tr><td rowspan="7">ස්ත්‍රී පුරුෂ භාවය සහා හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය (1.4)</td><td rowspan="7">හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම (1.4.2)</td><td>12 වගන්තිය යටතේ ගැසට් කිරීම</td><td colspan="3">>100%*1</td></tr>
<tr><td>බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන</td><td></td><td>61.57%</td><td></td></tr>
<tr><td>හිමිකම් විමර්ශන පැවැත්වීම</td><td></td><td></td><td>84.64%</td></tr>
<tr><td>ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම</td><td>39.55%</td><td></td><td></td></tr>
<tr><td>14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම</td><td></td><td></td><td>80.27%</td></tr>
<tr><td>14 වගන්තිය යටතේ ගැසට් කිරීම</td><td></td><td>63.46%</td><td></td></tr>
<tr><td>හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම</td><td></td><td>51.43%</td><td></td></tr>
</table>

>100%*1 12 වගන්තිය යටතේ ගැසට් කිරීමට අදාළ ප්‍රතිශතය ඉහත පරාසයන්ට අයත් නොවන අතර එහි අගය 171.86% කි.

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දැනට බිම් සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 121ක ක්‍රියාත්මක වන අතර තවදුරටත් බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 341ක් දක්වා වැඩි කිරීමට පියවර ගැනීම

- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධන ඇතුළත් කිරීමට පියවර ගැනීම.

- බිම්සවිය වැඩසටහනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	105	36	69
තෘතියික	09	05	04
ද්විතියික	1289	857	432
ප්‍රාථමික	380	161	219

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/අතිරික්තයෙහි බලපෑම

බිම් සවිය ක්‍රියාවලිය මුළු දිවයිනේම ක්‍රියාත්මක කිරීමේ පුළුල් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බැවින් ප්‍රාදේශීය කාර්යාල 56ක් මේ වන විට ආරම්භ කර ඇති අතර එම කාර්යාලවල මෙන්ම ප්‍රධාන කාර්යාලයේද **සේවක පුරප්පාඩු පවතී**. නමුත්, මෙතෙක් එම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ, තෘතියික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටනේ කාල සීමාව	සමස්ථ අයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය /දේශීය) විදේශීය)	නිමැවුම ලබාගත් දැනුම
			දේශීය	**විදේශීය**		
ධාරිතා සංවර්ධන වැඩසටහන (නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්)	28	දින 02 *	**2,442,787.00**		දේශීය	1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා ඊට සමගාමීව යන සියලු ඉඩම් නීති පිළිබඳව දැනුම්වත් වීම හා පසෙක තැබූ ගොනු සඳහා තීරණ ලබා දීමට අදාළව දැනුම්වත් වීම
ධාරිතා සංවර්ධන වැඩසටහන (හිමිකම් විමර්ශන නිලධාරී)	687					
ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය (ගණකාධිකාරි)	3	දින 01			දේශීය	ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා දැනුවත් වීම
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර පුහුණු වැඩසටහන	1	දින 01			දේශීය	පරිගණක දෘඩාංග පුහුණුව
පරිගණක ගත වැටුප්	3	දින 03	**21,000.00**		දේශීය	වැටුප් සකස් කිරීමේ පරිගණක ගත

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටනේ කාල සීමාව	සමස්ථ අයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය /දේශීය) විදේශීය)	නිමැවුම ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
සැකසීමේ ක්‍රියාවලිය(කළමනාකරණ සේවා නිලධාරී)						පුහුණුව ලබා ගැනීම
පත්ඉරු පරීක්ෂාව (හිමිකම් විමර්ශන නිලධාරී)	40	දින 01	**8,555.00**		දේශීය	පත්ඉරු පරීක්ෂාව පිළිබඳව දැනුම ලබා ගැනීම
ධාරිතා වර්ධන වැඩසටහන (රියදුරු)	38	දින 01	**77,780.00**		දේශීය	මාර්ග නීති පිළිපැදීම පිළිබඳ දැනුම ලබා ගැනීම
එකතුව	800	09	**2,550,122.00**			

*** දින දෙක බැගින් වැඩසටහන් දොළහක (12) ප්‍රමාණයකි.**

ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පුහුණු වැඩසටහන් වල දායකත්වය

මෙම දෙපාර්තමේන්තුවේ හිමිකම් විමර්ශන නිලධාරීන් සඳහා 2025 වර්ෂයේ ලබා දෙන ලද පුහුණු වැඩසටහන් මඟින් 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාම පිළිබඳව දැනුවත් කිරීමක්ද, පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳව අවසානාත්මක තීරණයක් ලබාදීම සඳහා වන නිවැරදි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන දැනුම ලබාගැනීමද, හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රමවේද, නෛතික පසුබිම, 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන පිළිබඳ අවබෝධය ලබාගැනීම යන පුහුණු වැඩසටහන් පවත්වන ලදි. මෙමඟින් පනතේ විධි විධාන පිළිබඳ පුළුල් විෂය දැනුමක් එම නිලධාරීන් වෙත ලබා දීමෙන් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය (බිම් සවිය වැඩසටහන) සාර්ථකව සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ සේවා නිලධාරීන්/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිළධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන මඟින් නිලධාරීන්ගේ විෂය දැනුම හා ආකල්පමය වර්ධනයක් තුළින් ආයතනයේ කාර්ය සාධනය වර්ධනය කරගැනීමට බලාපොරොත්තු වේ.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන ගිණුමක් නොපවතී	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් සකස් නොකරයි	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	විශේෂ අත්තිකාරම් ගිණුමක් නොපවති	
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	_		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරිම	_		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරිම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාලවලින් පිළිතුරු ලබා ගැනීමේදී සිදුවන ප්‍රමාදයන්	දුරකථනයෙන් හා ලිඛිතව සිහි කැඳවීම් යොමු කිරීමෙන් නියමිත කාලවකවානු තුළ පිළිතුරු ලබා දීමට නිරන්තර පසු විපරම් කිරිම
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			

8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අපහරණ ක්‍රියාවලියට අවශ්‍ය කටයුතු කරමින් සිටියි.	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	මෙම වර්ෂය සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුව ඇත.	ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සැලසුම් කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදි හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අක්‍රීය බැංකු ගිණුම් නොපවතී	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දි ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		

12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාල සඳහා නිකුත් කරනු ලබන අතුරු අග්‍රිම තැපැල් මඟින් චෙක්පත් යොමු කිරීම හා පියවීම් වවුචර්පත් ගෙන්වා ගැනීම නිසා යම්කිසි කාලයක් ගතවීම	
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	ආදායම් ගිණුම් නොපවති	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			

16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09. 20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම	අනුකූල වේ		

	සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	රා.ප.ච. 02/208 (I) අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්අත්සන් කිරීමට අවශ්‍ය නොවන බව දන්වා ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

නිරවුල් කිරීමේ නිලධාරීන් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

1903 – 1905	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1906	එච්.ඕ. ෆොක්ස් මහතා (වැ.බ.)
1907 – 1912	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1913	එච්.ඕ. ෆොක්ස් මහතා
1914	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1915 -1917	එච්.ඕ. ෆොක්ස් මහතා
1918	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1919 – 1920	එච්.ඕ. ෆොක්ස් මහතා
1921	ඩබ්ලිව්.ඊ. වේට් මහතා
1922 – 1923	එම්.එම්. වෙදර්බර්න් මහතා (වැ.බ.)
1924	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1925	එෆ්. බාට්ලට් මහතා
1926 – 1927	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1928	එම්.ටී. ආච්බල්ඩ් මහතා
1929 – 1930	ඩබ්ලිව්.ටී. ස්ටේස් මහතා
1931 – 1936	එච්.ඊ. ජැන්ස් මහතා (වැ.බ.)
1937 – 1939	එච්.ඊ. ජැන්ස් මහතා
1940	සී.එල්. වික්‍රමසිංහ මහතා
1941 – 1944	එච්.ඊ. ජැන්ස් මහතා
1945 – 1947	සී.බී.පී. පෙරේරා මහතා (වැ.බ.)
1948 – 1950	සී.බී.පී. පෙරේරා මහතා
1951 – 1954	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා (වැ.බ.)
1955 – 1958	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා
1959	එස්.එල්. ද සිල්වා මහතා (වැ.බ.)
1960	ආර්.ටී. රත්නතුංග මහතා (වැ.බ.)
1961 – 1963	ආර්.ටී. රත්නතුංග මහතා
1964 – 1974	එස්.එල්. ද සිල්වා මහතා
1975 – 1978	සී.එස්. රණසූරිය මහතා
1979 – 1980	අයි.ඒ. එදිරිවීර මහතා
1981 – 1983	කේ.පී. විමලධර්ම මහතා
1984 – 1987	ආර්.ඩබ්ලිව්. පියසේන මහතා
1988	ඒ. බොරළුගොඩ මහතා (වැ.බ.)
1989	ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා
1990 – 1993	ආර්.එම්.සී.පි. උඩුගම්පල මහත්මිය
1994	එච්. උඩකන්දගේ මහතා (වැ.බ.)
1995 - 1997	ආර්.එම්.සී.පි. උඩුගම්පල මහත්මිය
1997 – 2001	එච්. උඩකන්දගේ මහතා
2002 – 2003	එස්. එච්. විතානගේ මහතා
2004 – 2005	කේ.ඒ.ඩී.පි. පෝල් මහතා
2006 – 2008	පී.ඒ. මුතුකුමාරණ මහතා
2009 – 2010	ජී. විජිත නන්ද කුමාර් මහතා
2011	එල්.කේ. ජේමරත්න මහතා
2012 - 2013	ඒ.එච්.එස්. විජේසිංහ මහතා
2013 - 2015	ගාමිණී ඉලංගරත්න මහතා
2015	ජී. විජිත නන්ද කුමාර් මහතා
2015 - 2018	කේ. ඒ. කේ. රංජිත් ධර්මපාල මහතා
2019 - 2022.09.28	පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය
2022.09.29 සිට මේ දක්වා	පී.සී.ඩී.සිගේරා මහත්මිය

ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
හි.වි.නි. - හිමිකම් විමර්ශන නිලධාරී
ලේ.වි.නි. - ලේඛන විමර්ශන නිලධාරී
ලේ.ස. - ලේඛන සංරක්ෂක
සං.නි. - සංවර්ධන නිලධාරී
තො.ස.තා.නි. - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
තො.ස.තා.ස - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

ඇමුණුම අංක 02

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන



ඇමුණුම 03

Cumulative Commitment/ Liability Report for the Year - 2025

To
Department of Land Title Settlement (287)
From
Director General, ,
Department of State Accounts, ,
General Treasury, Colombo1. .

Printed by **yeni403**
New Table No **:SA-92**
Old Table No :--
Report Date 3/5/2026 10:17:58 AM

NEW CIGAS FINAL 2025 REPORTS

Nature	Commit_No	Date	To_whom	Vote	Commitment	Commit_bal	L_Date	Liability_amt	Revised_Lia	Paid	Liability_Bal	Reported_By
Govt	C/2025/HR/02	31 Dec 2025	B.G.K.R.K. Bulanewa	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/03	31 Dec 2025	L.D.I.U. Kumara	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/04	31 Dec 2025	A.M.C.J. Adhikari	287-2-01-000-1003-000/11-P	13,691.66	0.00	20 Jan 2026	13,691.66	0.00	0.00	13,691.66	287
Govt	C/2025/HR/05	31 Dec 2025	W.R.N.M. Dayananda	287-2-01-000-1003-000/11-P	27,272.50	0.00	20 Jan 2026	27,272.50	0.00	0.00	27,272.50	287
Govt	C/2025/HR/06	31 Dec 2025	K.A.S.M. Koralearachchi	287-2-01-000-1003-000/11-P	27,272.50	0.00	20 Jan 2026	27,272.50	0.00	0.00	27,272.50	287
Govt	C/2025/HR/07	31 Dec 2025	H.M.B.C.M. Kumara	287-2-01-000-1003-000/11-P	27,272.50	0.00	20 Jan 2026	27,272.50	0.00	0.00	27,272.50	287
Govt	C/2025/HR/08	31 Dec 2025	U.G.T.D. Jayarathna	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/09	31 Dec 2025	S.O.A.D.N.S, Samarasekara	287-2-01-000-1003-000/11-P	17,810.00	0.00	20 Jan 2026	17,810.00	0.00	0.00	17,810.00	287
Govt	C/2025/HR/10	31 Dec 2025	K.H.S.U.Yasanayaka	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/11	31 Dec 2025	K.L.P.Subhshini	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/12	31 Dec 2025	D.M.T.B.Dasanayaka	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/13	31 Dec 2025	A.A.S. Manike	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/14	31 Dec 2025	H.P.S. Madurangi	287-2-01-000-1003-000/11-P	20,537.50	0.00	20 Jan 2026	20,537.50	0.00	0.00	20,537.50	287
Govt	C/2025/HR/15	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	1,349.18	0.00	20 Jan 2026	1,349.18	0.00	0.00	1,349.18	287

Govt	C/2025/HR/16	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	3,090.96	0.00	20 Jan 2026	3,090.96	0.00	0.00	3,090.96	287
Govt	C/2025/HR/17	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	2,698.34	0.00	20 Jan 2026	2,698.34	0.00	0.00	2,698.34	287
Govt	C/2025/HR/18	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	2,698.34	0.00	20 Jan 2026	2,698.34	0.00	0.00	2,698.34	287
Govt	C/2025/HR/19	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	1,914.09	0.00	20 Jan 2026	1,914.09	0.00	0.00	1,914.09	287
Govt	C/2025/HR/20	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	850.70	0.00	20 Jan 2026	850.70	0.00	0.00	850.70	287
Govt	C/2025/HR/21	31 Dec 2025	D.M.C.K.Disanayaka	287-2-01-000-1003-000/11-P	12,240.00	0.00	26 Jan 2026	12,240.00	0.00	0.00	12,240.00	287
Govt	C/2025/HR/22	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	1,328.15	0.00	26 Jan 2026	1,328.15	0.00	0.00	1,328.15	287
Govt	C/2025/HR/23	31 Dec 2025	W.H.A. Sampath Rangajeewa	287-2-01-000-1003-000/11-P	7,000.00	0.00	27 Jan 2026	7,000.00	0.00	0.00	7,000.00	287
Govt	C/2025/HR/24	31 Dec 2025	A.S.N. AMarasinghe	287-2-01-000-1003-000/11-P	68,458.30	0.00	27 Jan 2026	68,458.30	0.00	0.00	68,458.30	287
Govt	C/2025/HR/25	31 Dec 2025	P.A Ariyadasa and Son	287-2-01-000-1301-000/11-P	5,850.00	0.00	27 Jan 2026	5,850.00	0.00	0.00	5,850.00	287
Govt	C/2025/HR/26	31 Dec 2025	R.M. Janani Buddima	287-2-01-000-1003-000/11-P	14,000.00	0.00	29 Jan 2026	14,000.00	0.00	0.00	14,000.00	287
Govt	C/2025/HR/27	31 Dec 2025	H.M. Dilhani Madushika	287-2-01-000-1003-000/11-P	15,000.00	0.00	29 Jan 2026	15,000.00	0.00	0.00	15,000.00	287
Govt	C/2025/HR/28	31 Dec 2025	Shroff - Land Title Settlement Department	287-2-01-000-1101-000/11-P	6,600.00	0.00	27 Jan 2026	6,600.00	0.00	0.00	6,600.00	287
Govt	C/2025/HR/29	31 Dec 2025	Shroff - Land Title Settlement Department	287-2-01-000-1101-000/11-P	8,424.00	0.00	27 Jan 2026	8,424.00	0.00	0.00	8,424.00	287
Govt	C/2025/HR/30	31 Dec 2025	Shroff - Land Title Settlement Department	287-2-01-000-1101-000/11-P	24,180.00	0.00	27 Jan 2026	24,180.00	0.00	0.00	24,180.00	287
Govt	C/2025/HR/31	31 Dec 2025	J.S.Jayasekara	287-2-01-000-1003-000/11-P	15,000.00	0.00	29 Jan 2026	15,000.00	0.00	0.00	15,000.00	287
Govt	C/2025/HR/32	31 Dec 2025	D.P.S.R. Jayasiri	287-2-01-000-1003-000/11-P	14,000.00	0.00	29 Jan 2026	14,000.00	0.00	0.00	14,000.00	287
Govt	C/2025/HR/33	31 Dec 2025	H.M. Madushani Nisansala	287-2-01-000-1003-000/11-P	14,000.00	0.00	29 Jan 2026	14,000.00	0.00	0.00	14,000.00	287
Govt	C/2025/HR/34	31 Dec 2025	K.A.C. Subashini	287-2-01-000-1003-000/11-P	14,000.00	0.00	29 Jan 2026	14,000.00	0.00	0.00	14,000.00	287
Govt	C/2025/HR/35	31 Dec 2025	A.M.J.W.K. Atthanayaka@3	287-2-01-000-1101-000/11-P	15,750.00	0.00	02 Feb 2026	15,750.00	0.00	0.00	15,750.00	287
Govt	C/2025/HR/36	31 Dec 2025	K.P.P.Madushan@6	287-2-01-000-1101-000/11-P	17,050.00	0.00	02 Feb 2026	17,050.00	0.00	0.00	17,050.00	287
Govt	C/2025/HR01	31 Dec 2025	R.R. Karannagoda	287-2-01-000-1301-000/11-P	1,840.00	0.00	12 Jan 2026	1,840.00	0.00	0.00	1,840.00	287
Govt	C/2025/HR100	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	14,721.11	0.00	31 Dec 2025	14,721.11	0.00	0.00	14,721.11	287

Govt	C/2025/HR101	31 Dec 2025	Sri Lanka Telecom PLC	287-2-01-000-1402-000/11-P	19,740.49	0.00	31 Dec 2025	19,740.49	0.00	0.00	19,740.49	287

This is a computer-generated document. No signature is required.

Report Generated by the new CIGAS Web Application--Developed by Department of State Accounts, Ministry of Finance Planing and Economic Development..

-

මගේ අංකය / எனது இல. / My No. ARI/E/LSD/FA/02/25/10 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2026 මැයි 15 දින

ගණන්දීමේ නිලධාරී
හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 287 - හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්

විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ ,මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තුමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමණාකරනය

2025 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැය ලේඛනය සැකසීමේදි නිසි අධ්‍යයනයකින් තොරව ප්‍රතිපාදන වෙන්කර ගැනීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. ගොඩනැගිලි සහ ඉදිකිරීම් , මෘදුකාංග සංවර්ධනය යන වියදම් වෙනුවෙන් වෙන් කරන

ලද ප්‍රතිපාදන නියමිත පරිදි කළමනාකරණය කර වියදම් දැරීමට කටයුතු නොකිරීම නිසා පිළිවෙළින් රු. 1,700,000 සහ රු 8,907,481 හෝ පිළිවෙලින් සියයට 68 සහ 73 වශයෙන් ඉතිරිවී තිබුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

නීති රීති රෙගුලාසිය	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	i. සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනකුගෙන් වර්ෂ 01 ත් 03 ත් අතර පවතින හිඟ ණය ශේෂය රු. 189,900 ක් විය.
	ii. වැඩ තහනම් කළ නිලධාරියකුගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂය රු. 30,271 ක් වූ අතර එම ණය ශේෂය වසර 1-3 අතර කාලයක සිට අය වී නොමැති බව නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

i. බිම්සවිය වැඩසටහන සඳහා 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා ලැබුණු ප්‍රතිපාදනය රු. මිලියන 4,382.20 ක් වූ අතර වියදම රු. මිලියන 2,916.81ක් වී තිබුණි. 1999 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මෙම වැඩසටහන සඳහා දරන ලද වියදම කොපමණද යන්න පිළිබඳ විස්තර වගකිව යුතු ආයතන විසින් සටහන් කර නොතිබුණි.

ii. බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක වන කාර්යාල 57 හි ආරම්භයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට ලැබුණු ඉඩම් කැබලි 1,943,657 ක ප්‍රමාණයෙන් ජනතාවට බෙදා දීමට හැකිවූ හිමිකම් සහතික පත්‍ර ප්‍රමාණය 482,139 ක් වූ අතර 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය කාර්යාලයන්හි ජනතාවට බෙදා දී නොමැති සහතික සංඛ්‍යාව 34,461 ක් විය. විවිධ ගැටලු සහිත ඉඩම් කැබලි සම්බන්ධයෙන් ඉදිරියේදී තීරණ ගැනීම සඳහා පසෙක තබා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 443,012 ක් බව නිරීක්ෂණය විය.

4.2 ආර්ථික නොවන ගණුදෙනු

(අ) **ලේඛණ පරිලෝකණය කිරීම**

ආයතන සංග්‍රහයේ XXVIII- 9.3 , 9.4 වගන්ති අනුව පොදු ලේඛණවල ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාරදීම හෝ ක්‍රමවත්ව ආරක්ෂා කිරීමට කටයුතු කල යුතු වුවත් එසේ නොකර වසර ගණනාවකින් පසුව දිරාපත්වූ ලේඛන පරිලෝකනය කිරීමට දෙපාර්තුමේන්තුව කටයුතු කර තිබුණි.ඒ අනුව පැරණි ලේඛන පරිලෝකනය කිරීමේ හා සංරක්ෂණය කිරීමේ කටයුතු අදියර 03 ක් යටතේ සිදු කිරීමට 2021 වර්ෂයේ සිට ප්‍රසම්පාදන කටයුතු සිදුකර පිටු 496,750 කට ආසන්න ප්‍රමාණයක් පරිලෝකනය කර 2025 දෙසැම්බර් 31 දින වන විට රු. 26,428,529.58 ක් අදියර 04ක් සඳහා කොන්ත්‍රාත් සමාගම වෙත ගෙවීම් කර තිබුණි.

(ආ) වාහනය අලුත්වැඩියා කිරීම

අබලන්ව පැවති හා 2024 හා 2025 වර්ෂයන්හි ධාවනය වූ දුර පිළිවෙළින් කි.මී. 361 ක් හා කි.මී. 1423 ක් වන KH – 5708 දරන වාහනය 2024 වර්ෂයේදී රු. 1,104,600 ක් වැයකර අලුත්වැඩියා සිදු කළද ධාවන තත්වයට ගැනීමට නොහැකි විය.

(ඇ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන ආහාර ගබඩා සංකීර්ණයේ ගොඩනැගිල්ලක් මොරටුව, රත්මලාන හා දෙහිවල බිම්සවිය ප්‍රාදේශීය කාර්යාල 03 ස්ථාපිත කිරීම් සඳහා රු.9,963,370ක මුදලක් කොන්ත්‍රාත් ආයතනය වෙත ගෙවීම් කර 2023 දෙසැම්බර් 22 වන විට වැඩ අවසන් කර, මාස 08 කට පසු මොරටුව ප්‍රාදේශීය කාර්යාලය පමණක් එහි කාර්යාල කටයුතු ආරම්භ කර තිබුණි. පසුව මෙම ගොඩනැගිල්ලෙහි කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට නොහැකි බව තීරණය වී 2025 පෙබරවාරි 10 දින නුගේගොඩ දෙල්කඳ පිහිටි කාර්යාලය වෙත නැවත මාරු කිරීම හේතුවෙන් එම දරන ලද පිරිවැය අනාර්ථක වියදමක් වී තිබුණි.

(ඈ) ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීමේදී, ප්‍රමාණවත් පහසුකම් සහිත රජයේ ගොඩනැගිලි සොයා ගැනීමට නොහැකිවීම මත කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි 35 ක කාර්යාල පිහිටුවා තිබුණු නමුත් සනීපාරක්ෂක කටයුතු ප්‍රමාණවත් නොවීම, ජලය ලබා ගැනීමේ අපහසුව, වාතාශ්‍රය නොලැබෙන ගොඩනැගිලි, අධික රස්නය, මහා මාර්ග අසන්නයේ පිහිටුවා තිබීම, අධික දූවිලි දුම ආදී අපහසුතා රාශියක් ඒවායෙහි දක්නට ලැබුණි. මෙම නිවාස සඳහා 2024 වර්ෂයේ දී හා 2025 වර්ෂයේ දී බාහිර පුද්ගලයන් වෙත ගෙවා ඇති කුලී ගාස්තුව පිළිවෙළින් රු. 21,351,447 ක් හා රු. 23,641,099 ක් වී තිබුණි.

4.3 කළමනාකරණ දුර්වලතා.

(අ) 2025 වර්ෂය ආරම්භයේදී සමස්ත දිවයින තුළ බිම්සවිය වැඩසටහනේ ඉඩම් කැබලි 83,200 කට හිමිකම් සහතික ලබාදීමට ඇස්තමේන්තු කර පසුව එම සැලසුම 65,408 ක් දක්වා ඉලක්කය අඩුකර තිබුණු නමුත් සත්‍ය ලෙස සහතික නිකුත් කළ ප්‍රමාණය ඉඩම් කැබලි 18,794 ක් විය. ගැටලු පැවතීම නිසා සහතික නිකුත් නොකළ පසෙක තැබූ කැබලි ප්‍රමාණය 19,604 ක් විය. ඒ අනුව 2025 වර්ෂයේ ජනවාරි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා හිමිකම් සහතික එකක් හෝ ලබාදීමට අපොහොසත් වූ ප්‍රාදේශීය කාර්යාල 12 ක් පැවතුනි.

(ආ) ප්‍රාදේශීය කාර්යාලයන්හි ස්ථිර සේවයේ හා පූර්ණකාලීනව සේවයේ යෙදී සිටිය යුතු තනතුරුවන නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරයෙකු ස්ථිරව පත් කිරීමට නොහැකි වීම මත කොමසාරිස් (විමර්ශන), කොමසාරිස් (පාලන), නියෝජ්‍ය කොමසාරිස් (ඉඩම්) සහ සහකාර කොමසාරිස් (ඉඩම්) යන තනතුරු දරන නිලධාරීන් 04 දෙනා කොළඹ ප්‍රධාන කාර්යාලයේ රාජකාරියට අමතරව ප්‍රාදේශීය කාර්යාල 02 ක හෝ 03 ක රාජකාරී ආවරණය කිරීම සඳහා යොදවා තිබුණි.

(ඇ) බිම්සවිය වැඩසටහන සාර්ථකව කරගෙන යාම සඳහා අවශ්‍ය භෞතික, මානව සම්පත් අවම මට්ටමකවත් නොමැති තත්ත්වයක් තුල 2020 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ පමණක් ප්‍රාදේශීය කාර්යාල 12 ක් ආරම්භ කර තිබුණු අතර මෙම කාර්යාල සඳහා කාර්ය මණ්ඩලය 111 ක් අනුයුක්ත කර මාසිකව රු. 6,645,269 ක් බැගින් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. මෙම කාර්යාල 12 විසින් 2025 වර්ෂය වන විට මහජනතාව වෙත නිකුත් කර ඇති සහතික පත්‍ර සංඛ්‍යාව 293 ක් වන අතර පසෙක තබා ඇති ලිපිගොනු සංඛ්‍යාව 3,971 ක් වී තිබුණි.

(ඈ) 2023 වර්ෂයේ සිට දෙපාර්තුමේන්තුවෙහි පරිපාලනය විසින් සැලසුමකට අනුව ඉඩම් මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තුමේන්තුව වෙත ඉල්ලීම් නොකිරීම නිසා මාස 18ක පමණ කාලයක් සඳහා කැස්බෑව ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන්ට රාජකාරී ඉටු කිරීමට මිනුම් කරන ලද බිම් කැබලි නොමැති වීම හේතුවෙන් එම කාලය තුලදී වැටුප් හා වේතන ගෙවා සේවයක් ලබා ගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය.

(අ) දෙපාර්තමේන්තුවෙහි අනුමත කාර්ය මණ්ඩලයේ 1783 අතරින් තත්‍ය කාර්ය මණ්ඩලය 1059 ක් වී තිබුණි. මෙම කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට 2025.12.31 දින දක්වා කාලය තුල කාර්යභාරයේ සිදු වූ වෙනස්වීම් වලට අනුකූලව සංශෝධනයන් සිදු වී නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය කාර්යාලවල සේවය කිරීම සඳහා අධීක්ෂණ නිලධාරීන්ගේ පවතින හිඟය නිසා වැඩබැලීමේ තනතුරු ලෙස සහකාර ප්‍රාදේශීය ලේකම්වරු හා සහකාර දිස්ත්‍රික් ලේකම්වරුන් 13 දෙනෙකු බඳවාගෙන තිබුණි. මීට අමතරව හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 19 දෙනෙකු වැඩබැලීමේ තනතුරු සඳහා පත්කර තිබුණු අතර මේ සඳහා 2024 වර්ෂය තුළදී රු. 2,511,487 ක්ද, 2025 වර්ෂයේදී රු. 4,120,378 ක්ද ලෙස ගෙවීම් කර තිබුණි.

එච්. එන් රණතුංග
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට